www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 6 – Second Term Test – July 2019

දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 6 ශ්‍රේණිය

කාලය : පැය
Time : hours

## DANCING - I

## නර්තනය – I

Name :- ..................................................... Grade : -................ Index number:-....................

➢ නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. සිට ගැනීම, ඉඳ ගැනීම වැනි ශාරීරික ක්‍රියාකාරකම් අයත් වන්නේ,

   (i) ස්ථිතික චලනයන්ට (ii) සංචාරික චලනයන්ට
   (iii) ප්‍රකාශනාත්මක චලනයන්ට (iv) තාලානුකූල චලනයන්ට

2. උඩරට නර්තන සම්ප්‍රදායේ පා සරඹ වෙනුවට පහතරට නර්තන සම්ප්‍රදායේ .................................. නටනු ලැබේ.

   (i) ගොඩ සරඹ (ii) දොම්න පද
   (iii) අත් සරඹ (iv) ඉලංගම් සරඹ

3. "අහසේ දෙවියෝ රැස්ව සිටින්නයි" කවි පදය අයත් වන්නේ,

   (i) කළගෙඩි කවිවලටය (ii) ලීකෙළි කවිවලටය
   (iii) නැලවිලි කවිවලටය (iv) මේවර කවිවලටය

4. අවුරුදු සමයේදී දක්නට ලැබෙන ජන ක්‍රීඩාවකි,

   (i) ක්‍රිකට් ක්‍රිඩාව (ii) එල්ලේ ක්‍රීඩාව
   (iii) චක්ගුඩු ක්‍රීඩාව (iv) කැරම් ක්‍රීඩාව

5. "තාලම්පට" ප්‍රධාන වාද්‍ය භාණ්ඩයක් වශයෙන් භාවිත වන්නේ,

   (i) තාල තැබීම සඳහාය (ii) වාදනය කිරීම සඳහාය
   (iii) නැටීම සඳහාය (iv) විධානය දීම සඳහාය *(ලකුණු - 05)*

➢ නිවැරදි හෝ ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න.

| | |
|---|---|
| 6. "පාන්දරින් ඉස්කෝලේට" ගීතය | භක්ති ගීත |
| 7. මාත්‍රා පහ නැටුම් අංගය දැකිය හැකිය | නමස්කාරය |
| 8. වෙසක් උත්සවය | නැලවිලි කවි |
| 9. ලයාන්විත බව | සමන් දේවාල පෙරහැර |
| 10. නර්තනය කිරීමට ප්‍රථම | හර්ෂණ දිසානායක *(ලකුණු - 05)* |

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

➢ පහත දැක්වෙන වාක්‍ය හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

11. සමූහ වාදන වලදී "විධානය" හා "අවධානය" එතරම් වැදගත් නොවේ. ( )
12. ගැමි නැටුමක් නිර්මාණය කිරීමේදී රංග රටාව වැදගත් වේ. ( )
13. කොහොඹ කලය වෙනත් සංස්කෘතීන්ට අයත් ගැමි නැටුමක් නොවේ. ( )
14. පෙරහැරක විචිත්‍රවත් බව රැක ගැනීමට සැරසිලි හා රංග වස්ත්‍රාභරණ අත්‍යවශ්‍ය වේ. ( )
15. පා සරඹ නැටීමේදී නිවැරදි අංගහාර භාවිත නොවේ. ( )

*(ලකුණු - 05)*

➢ පහත වගුව ඇසුරු කර ගනිමින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(රබන් පදයකි, රුංතක ජිංතක තරිකිට කුංදත්, සුළු තනි තිත, අත් සරඹ, ගොඩ සරඹ කස්තිරමකි)

16. තත් ජිත් තොං නං තා යන මෙම පද කොටස

..............................................................................................................................

17. උඩරට නර්තන සම්ප්‍රදායේ ගොඩ සරඹ සඳහා භාවිත කරන වෙනත් නමක් වනුයේ

..............................................................................................................................

18. හනුමා වන්නමට අයත් කස්තිරම ආරම්භ වනුයේ,

..............................................................................................................................

19. උඩින් උඩින් වර පෙත්තප්පු

..............................................................................................................................

20. තති තිතේ ප්‍රභේදයකි.

..............................................................................................................................

*(ලකුණු - 05)*

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

## II කොටස

➢ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.

01. පංති කාමරයේදී ඔබ උගත් විවිධ ජනවර්ග හා බැඳි උත්සවයන් මතකයට නංවා ගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

➢ බුදු පියානෙණි.......... ඔබේ පාද කරනෙම් පිණිපා..........

(i) ඉහත ගීතය නිතර ශ්‍රවණය වන්නේ කුමන උත්සව සමයකදී ද? *(ලකුණු - 02)*

(ii) එම උත්සවය විචිත්‍රවත් කරන සැරසිලි දෙකක් නම් කරන්න. *(ලකුණු - 02)*

(iii) එම උත්සවයේදී හා තෛපොංගල් උත්සවයේදී දක්නට ලැබෙන සැරසිලි අංග 02ක් නම් කරන්න. *(ලකුණු - 02)*

(iv) තෛයිපොංගල් උත්සවය පැවැත්වෙන මාසය හා "තෛපොංගල්" යන වචනයේ අර්ථය දක්වන්න. *(ලකුණු - 02)*

(v) තෛයිපොංගල් උත්සවය හා සබැඳි චාරිත්‍ර නම් කරන්න. *(ලකුණු - 02)*

02. (i) නම්‍යතා අභ්‍යාසයේ විශේෂ ලක්ෂණ හතරක් ලියන්න. *(ලකුණු - 04)*

(ii) නම්‍යතා අභ්‍යාසයේදී ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න. *(ලකුණු - 04)*

(iii) නම්‍යතා අභ්‍යාසයේදී ප්‍රයෝජනයට ගන්නා ශරීරයේ අංගයන් දෙකක් නම් කරන්න. *(ලකුණු - 02)*

03. (i) ද්‍රවිඩ ගැමි නැටුම් දෙකක් නම් කරන්න. *(ලකුණු - 02)*

(ii) එම ගැමි නැටුම් වලට සමානකම් දක්වන සිංහල ගැමි නැටුම් දෙකක් නම් කරන්න. *(ලකුණු - 02)*

(iii) ද්‍රවිඩ ගැමි නැටුම් නැරඹිය හැකි අවස්ථා සඳහන් කරන්න. *(ලකුණු - 03)*

(iv) සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම්වල දැකිය හැකි සමාන හා අසමානතා අවස්ථා තුනක් සඳහන් කරන්න. *(ලකුණු - 03)*

04. (i) සාම්ප්‍රදායික නර්තන සම්ප්‍රදායන් නම් කර ඊට අදාළ වාද්‍ය භාණ්ඩ නම් කරන්න. *(ලකුණු - 04)*

(ii) විවිධ ශබ්ද හා නාද නිපදවිය හැකි විකල්ප වාද්‍ය උපකරණ තුනක් නම් කරන්න. *(ලකුණු - 03)*

(iii) විකල්ප වාද්‍ය භාණ්ඩ වාදනය කළ හැකි අවස්ථා නම් කරන්න. *(ලකුණු - 03)*

05. (i) ගැමි නැටුම්වල විශේෂ ලක්ෂන තුනක් ලියන්න. *(ලකුණු - 03)*

(ii) ගැමි නැටුම් සඳහා යොදා ගන්නා උපකරණ තුනක රූප සටහන් අඳින්න. *(ලකුණු - 03)*

(iii) ඉහත උපකරණයට අදාල ගැමි නැටුමකට අයත් කවියක් ලියන්න. *(ලකුණු - 04)*

Agaram.LK - Keep your dreams alive!
agaram.lk